**ශීර්ෂය 1 - ජනාධිපති කාර්යාලය**
**-------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**
**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

ජනාධිපති කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනාධිපති කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ජනාධිපති කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 31 වන දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජනාධිපති කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
**------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජනාධිපති කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ජනාධිපති කාර්යාලය මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ජනාධිපති කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හාඅන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,
මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ජනාධිපති කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.6.1 **දේපල පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හඳුන්වා දී ඇති නව සිගාස් වැඩසටහන යටතේ මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කර ඇති, මූල්‍ය නොවන වත්කම් වටිනාකම් අතර පහත පරිදි වෙනස්කම් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශනවල හා සැසඳුම් ප්‍රකාශනවල නිවැරදි හා යාවත්කාලීන තොරතුරු ඇතුළත් කළ යුතුය. | වත්කම් තක්සේරු කිරීමෙන් පසුව වටිනාකම් නව සිගාස් වැඩසටහන හරහා ගිණුම්ගත කිරීම සිදු කෙරෙමින් පවතින අතර මෙම වර්ෂය අවසාන වීමට ප්‍රථම සියලු දත්ත නව සිගාස් වැඩසටහන හරහා ගිණුම්ගත කරන බව කාරුණිකව දන්වමි. |

| වත්කම් කාණ්ඩය | වත්කම | 2018/12/31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | නව සිගාස් වැඩසටහන යටතේ ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 9151 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 4,004,731,245 | 42,173,777 | 3,962,557,468 |
| 9152 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 6,266,866,200 | 535,873,351 | 5,730,992,849 |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | 70,349,494 | (70,349,494) |
| | එකතුව | 10,271,597,445 | 648,396,622 | 9,623,200,823 |

**1.6.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. ජනාධිපති කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි කලයුතු සහතික විම 2019 වර්ෂයේ සිට ලබාදිය හැකි බව කාරුණිකව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය - ආදායම් සංකේතාංකය - 10.02.11.00 - දුරකථන ග්‍රාහක බද්ද

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2011 අංක 21 දරණ විදුලි සංදේශ නියාමන බදු පනතේ 2 වගන්තිය ප්‍රකාරව, 2011 ජනවාරි 01 දින සිට විදුලි සංදේශන සේවාව ලබන සෑම පුද්ගලයෙකුගෙන්ම විදුලි සංදේශන බද්දක් අයකල යුතු වුවද, විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පෞද්ගලික ආයතනයක් එසේ බදු ගෙවන බව විගණනයේදී තහවුරු නොවීය. | ආදායම් කළමනාකරණය විධිමත් කළ යුතුය. | 2018 වසරට අදාල විදුලි සංදේශ බදු අය කර ගැනිම සඳහා වන මූලික නීතිමය කටයුතු ආරම්භ කර ඇති බව කාරුණිකව දන්වමි. |
| (ආ) | කිසියම් වර්ෂයකට අදාල හිඟ විදුලි සංදේශ බදු ආදායම ගණනය කිරීමේදී, ඊට පසු වර්ෂය තුලදී අදාල දුරකතන සමාගම් විසින් ගෙවනු ලබන බදු වටිනාකම පදනම් කරගෙන තිබූ අතර එසේ පසු වර්ෂ වලදී හිඟ බදු නොගෙවන අවස්ථා වලදී, එපරිදි හිඟ ආදායම් හඳුනා ගැනීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් නොවීය. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනට අදාළ ආයතන විසින් තවදුරටත් ගෙවිය යුතු හිඟ විදුලි සංදේශන බද්ද රු. 10,183,893 ක් වී තිබුණි. | හිඟ ආදායම් අය කර ගැනීම විධිමත් හා කඩිනම් කළ යුතුය. | ඉන් රු.967,109,255.28 ක් එකතු කර ගන්නා ලද අතර, ඉතිරි හිඟ මුදල වන රු.10,183,892.72 එකතු කිරීමට පියවර ගෙන ඇති බවත් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මා වෙත දන්වා ඇති බව කාරුණිකව දන්වමි. |

## 2.2 ආදායම් සංකේතයක් නොමැතිව ආදායම් රැස්කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) අනුව්‍යවස්ථාව අනුව, සියලුම අයබදු, තීරුබදු, වරිපනම් හා ගාස්තු යන මාර්ගවලින් ලැබෙන ආදායම්ද, නියමිත කාර්ය සඳහා වෙන් කරනු නොලැබූ ජනරජය සතු සෙසු සියලුම ආදායම් හා ලැබීම්ද ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු වුවද, නෙළුම් පොකුණ රඟහලේ ප්‍රධාන රංගශාලාව, එළිමහන් රංගශාලාව, පෙර පුහුණුවීම් ශාලාව, විවෘත රථගාල හා ආපනශාලාව 2011 වර්ෂයේ සිට කුළියට ලබාදීම තුළින් උපයා තිබූ ආදායම් හා ලැබීම් එසේ ඒකාබද්ධ අරමුදලට බැර නොකොට පොදු තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2018 වර්ෂයේදී එම තැන්පත් ගිණුමේ ලැබීම් රු. මිලියන 159.05 ක් වූ අතර ඉන් රු. මිලියන 83.39 ක් වියදම් දරා තිබුණි. එසේම, 2018 දෙසැම්බර් 31 දිනට ගිණුමේ ශේෂය රු. මිලියන 254.13 ක් විය. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව සියලුම ආදායම් හා ලැබීම්ද ඒකාබද්ධ අරමුදලට ගෙවිය යතු විය. | නෙළුම් පොකුණ රඟහලේ වියදම් දැරීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සඳහා ඉල්ලුම් කලද ඒ සඳහා ප්‍රතිපාදන සලසා දීමක් සිදු නොකරන ලදී. එබැවින් රඟහල කුලියට දීම මගින් ලැබෙන ආදායම තැන්පත් ගිණුමට බැර කර එමගින් එහි වියදම් දරන ලදී. |

## 2.3 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජනාධිපති කාර්යාලයේ 2018 -වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව පුනරාවර්තන වැය විෂයයන් 04 ක් හා මූලධන වැය විෂයයන් 05 ක් සඳහා වෙන් කරන ලද එකතුව රු. 2,251,600,000 ක් වූ ප්‍රතිපාදන ප්‍රමාණය, එම වැය විෂයයන් සඳහා වර්ෂය තුළ පරිපූරක ඇස්තමේන්තු මඟින් වෙන් කරන ලද රු. 610,000,000 ක් වූ ප්‍රතිපාදන සමඟ සැසඳිමේදී, පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ප්‍රමාණය අයවැයගත ඇස්තමේන්තු ප්‍රතිපාදනයට සාපේක්ෂව සියයට 5 සිට සියයට 155 දක්වා වූ පරාසයක විය. | අයවැය යෝජනාවල ඇතුලත් කාර්යන් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වෙන්කල මූල්‍ය ප්‍රතිපාදනය, සැලසුම් කල පරිදි දැරීම පිළිබඳව හා නිවැරදි පුරෝකතනයන් මත ඇස්තමේන්තු පිළියෙල කිරීම පිළිබඳව අවධානය යොමුකල යුතුය. | නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, 2018 ජනවාරි සිට වැටුප් වැඩිවීම , 1/3 හා ¼ දීමනා නව වැටුපට ගෙවීම, හිඟ බිල්පත් ගෙවීම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම වැනි හේතු නිසාවෙන් අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු විය. |
| (ආ) | 2018 - වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව, මූලධන වැය විෂයයන් 04 ක් සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ශුන්‍ය අගයක් ගෙන තිබුණද, පරිපූරක ඇස්තමේන්තු මඟින් එම වැය විෂයයන් සඳහා රු. 340,890,000 ක ප්‍රතිපාදන වෙන් කරවා ගෙන වියදම් කර තිබූ බව නිරීක්ෂණය විය. | අයවැය යෝජනාවල ඇතුලත් කාර්යන් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වෙන්කල මූල්‍ය ප්‍රතිපාදනය, සැලසුම් කල පරිදි දැරීම පිළිබඳව හා නිවැරදි පුරෝකතනයන් මත ඇස්තමේන්තු පිළියෙල කිරීම පිළිබඳව අවධානය යොමුකල යුතුය. | අය වැය යෝජනා 2ක් ක්‍රියාත්මක කිරීම සඳහා, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හවුල්කාරීත්ව වැඩසටහන සඳහා සහ ශ්‍රී ලංකා අමරපුර සංඝ සභාවේ අති ගෞරවනීය කොටුගොඩ ධම්මාවාස මාහිමිපාණන් වහන්සේගේ නිල කටයුතු සඳහා මෝටර් රථයක් මිලදී ගැනීම සඳහා මෙම අතිරේක ප්‍රතිපාදනය සලසා ගන්නා ලද බව කාරුණිකව දන්වමි. |
| (ඇ) | වැය විෂයයන් 19 ක් යටතේ අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 සිට සියයට 100 දක්වා වූ පරාසයක් තුල ඉතිරිවීම් නිරීක්ෂණය වු අතර ඉන් වැය විෂයයන් 15 ක සියයට 50 ට වඩා වැඩි ප්‍රතිපාදනයන් ඉතිරි වි තිබුණි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් වෙන් කළ ප්‍රතිපාදන, සැලසුම් කළ පරිදි උපයෝජනය කළ යුතුය. | අක්මුදල් නොලැබීම, විදේශ ප්‍රදාන නොලැබීම, ගිවිසුම්ගත ව්‍යාපෘති නතර කිරීම, ප්‍රසම්පාදන කටයුතු අවසන් නොවීම හා ඉදිකිරීම් කටයුතු සිදු නොවීම ආදි හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

**2.4** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව හා මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කර ඇති බැරකම් අතර රු. 57,908,820 වෙනස්කම් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි හා යාවත්කාලීන තොරතුරු ඇතුළත් කළ යුතුය. | නව සිගාස් වැඩසටහන හරහා වාර්තා කර ඇති බැරකම් තුළ 2018.12.31 දිනට අක්මුදල් නොමැතිව ගෙවීම් කිරීමට නොහැකි වූ බැරකම් ඇතුළත් වන අතර, මූල්‍ය ප්‍රකාශනවල ඒදිනට අක්මුදල් නොමැතිව ගෙවීම් කිරීමට නොහැකි වූ බිල්පත්වල වටිනාකම සහ 2018.12.31 දිනෙන් පසු ලැබුණු, 2018 වර්ෂය වෙනුවෙන් ඇතිකරගත් බැදීම්වලට අදාලව ගෙවීම් කරන ලද වව්වර්පත්වල විටිනාකම යන දෙකේ එකතුවක් බව කාරුණිකව දන්වමි. |

**2.5** **තැන්පතු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මු.රෙ. 571 ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවද, ජනාධිපති කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමක 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 ක් ඉක්මවූ රු. 50,000 ක තැන්පතු රඳවාගෙන තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. | ඉතිරිව පවතින රු. 50,000/- ක ශේෂය ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යසාධනය**

**3.1.1** **සැලැසුම් කිරිම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, අංක 01/2014 හා | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම | 2019 වර්ෂයට අදාල ක්‍රියාකාරි සැලැස්ම,2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 එදරන |

| | | |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් අනුව පිළියෙල කර නොතිබුණි. | පිළියෙල කළ යුතුය. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සංශෝධන සිදු කිරීම සඳහා කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## 3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව, ජනාධිපති කාර්යාලයේ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය විසින් ක්‍රියාත්මක කෙරුණු වැඩසටහන් 03 ක සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සත්‍ය වියදම හා ඉතිරිය පහත පරිදි විය. | සැලසුම් කළ පරිදි, අදාල කාර්යයන් ඉටු කළ යුතුය. | සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයට අදාලව ක්‍රියාත්මක කරන ලද ජාතික වැඩසටහන්වල ඉතිරිවීම් සඳහා හේතු අතර අක් මුදල් නොලැබීම, අදාල ආයතන වෙත ප්‍රතිපාදන ලබා දුන්නද වියදම් නොවීම, ප්‍රසම්පාදන කටයුතු අවසන් නොවීම යනාදිය වේ. |

| වැඩසටහන | 2018 අයවැය ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ඉතිරිවීම් | ප්‍රතිපාදනයට සාපේක්ෂව ඉතිරිවීම් |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | % |
| පරිසර සංරක්ෂණ ජා.වැ.ස. | 496 | 225.8 | 270.2 | 54 |
| දරුවන් සුරකිමු ජා.වැ.ස. | 149 | 109.5 | 39.5 | 26 |
| ජාතික සංස්කෘතික පුනර්ජීවනය උදෙසා වන විශේෂ මෙහෙයුම් ඒකකය | 16 | 8.6 | 7.4 | 46 |
| | 1400 | 1020.2 | 379.8 | |

මේ අනුව, වැඩසටහන්වල ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 26 සිට සියයට 54 දක්වා පරාසයක විය.

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 වර්ෂයේ ජනාධිපති කාර්යාලයේ කාර්යසාධන වාර්තාව හා විගණනයට ඉදිරිපත් කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම වැඩසටහන් 06 ක් සඳහා වූ අයවැය ප්‍රතිපාදන අතර රු. මිලියන 203 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | පොත්පත් හා ලිපිලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතුය. | අමතර ප්‍රතිපාදන ලබා ගැනීමට සිදුවීම හා වෙනත් වැඩසටහන් සඳහා මාරු කිරීම යනාදී කරුණු වෙනසට හේතු විය. |
| (ඇ) | ජනාධිපති කාර්යාලය විසින් ඉහත කී එක් එක් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දුන් ප්‍රතිපාදන හා ඒවායේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී නියැදි පදනම මත තෝරා ගත් නුවරඑළිය දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| **(i)** | ග්‍රාම ශක්ති ව්‍යාපෘතිය යටතේ වලපනේ ගල්කඩපතන ග්‍රාම නිලධාරී වසමේ කෝපි වගාව සංවර්ධනය සඳහා ආරක්ෂිත ගෘහ දෙකක් රු. 666,640 ක වියදමින් ගම්මානයේ ඉදිකර තිබුණි. කෝපි තවාන් කිරීම සඳහා ආරක්ෂිත ගෘහයක් ඉදිකිරීම සඳහා වන ඇස්තමේන්තුව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරයකු සකසා තිබූ අතර, ඒ අනුව ගෘහය සඳහා වැය වන GI බට ප්‍රමාණය හා දැල් වර්ග මීටර් ප්‍රමාණ දක්වා තිබුණි. ඒ අනුව කාර්මික සහායකවරයා බිල්පත ඉදිරිපත් කර තිබූ නමුත් ක්ෂේත්‍රයේ ඉදිකළ ගෘහයේ දිග පළල හා උස අනුව වන කිසිදු මිනුමක් බිල්පතේ සඳහන් කර නොතිබූ බැවින්, මිනුම් පරීක්ෂා කළ නොහැකි විය. | ලිපිලේඛන යාවත්කාලීන කිරීමට උපදෙස් ලබා දිය යුතුය. | මැනුම් පත අතපසු වීමක් හේතුවෙන් ගොනුවට ඇතුලත් කිරීමට නොහැකි වි ඇත. |
| (ii) | ග්‍රාම ශක්ති වැඩසටහන යටතේ කෙහෙල්කොළ යොදා ගනිමින් පරිසර හිතකාමී ලන්ච්ෂීට් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රු. 357,000 ක වියදමින් යන්ත්‍රයක් මිලදී ගෙන තිබූ අතර, යන්ත්‍රය ස්ථාපිත කර ඇති ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා රු. 1,254,220 ක වියදමක් දරා තිබුණි. යන්ත්‍රය ස්ථාපිත කර ඇති ගොඩනැගිල්ලේ ජනේල සඳහා ආරක්ෂිත ග්‍රිල් යොදා නොමැති බැවින්, එය යන්ත්‍රයේ ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බව නිරීක්ෂණය විය. මූලිකව වසම් තුළ පවතින කෙසෙල් පත්‍රවලින් ලන්ච්ෂීට් නිපදවීමටත්, කැවන්ඩිෂ් වර්ගයේ කෙසෙල් පැල 1500 ක වගාවක් 2018 දෙසැම්බර් මස ආරම්භ කිරීමටත් සැලසුම් කර තිබුණද, විගණිත 2019 පෙබරවාරි 14 දින දක්වා කෙසෙල් පැල මිලදීගෙන නොතිබුණ අතරම ලන්ච්ෂීට් නිෂ්පාදනයද ආරම්භ කර නොතිබුණි. | අපේක්ෂිත අරමුණ ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. | ජල මූලාශ්‍ර 91න් 40ක පමණක් මැනීම් කටයුතු සිදුකිරීමට හැකි වී ඇත. වෙන් කර තිබූ ඉතිරි රු.700,000ක මුදල ඊසාන දිග මෝසම නොවැම්බර් මාසයේ සක්‍රීය වීම හා වර්ෂාවසානයේ ගිණුම් පියවීම සඳහා පැවති සීමිත කාලයත් නිසාවෙන් නැවත ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| **(iii)** | පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන 2016-2018 වැව්ලි සමාගම්වල ජලමූලාශ්‍ර සංරක්ෂණ ව්‍යාපෘතිය සඳහා රු. 3,082,500 ක ප්‍රතිපාදන වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ජනාධිපති කාර්යාලයෙන් ලබාදී ඇති අතර ව්‍යාපෘති යෝජනාවට අනුව ජල මූලාශ්‍ර පිහිටි ඉඩම් කොටස් 91 ක් පවතින බව හඳුනාගෙන ඇතත්, ඉඩම් මැනීම් කර ඇත්තේ ඉඩම් කට්ටි 40 ක පමණි. 2018 සැප්තැම්බර් මස 14 මෙම මුදල් ප්‍රතිපාදන ලබාදී ඇති අතර ජල පෝෂක ප්‍රදේශ මැනීම පමණක් සිදුකර ඇතත්, කණු සිටුවා ඒවා වෙන් කිරීමේ කාර්යය ඉටුකර නොමැති බැවින්, ව්‍යාපෘතියේ අරමුණ ඉටුවී නොතිබුණි. වැව්ලි | අපේක්ෂිත අරමුණ ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. | කෙසෙල් පැළ 1500ක් ලබාදීමට පැළ තවන්කරුවන්ට මාස 06ක පමණ කාලයක් ගතවන බවත් එම හේතුවෙන් විගණිත දිනය වන 2019 පෙබරවාරි 14 වන දින ද එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි |

| | | | |
|---|---|---|---|
| | සමාගම්වලට අයත් ඉඩම්වල ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම වෙනුවට පුද්ගලික ඉඩම් තුනක පාංශු සංරක්ෂණය කිරීම වෙනුවෙන් ඉඩම් හිමිකරුවන්ට රු. 50,000 ක් ගෙවීම් කර තිබුණි. ව්‍යාපෘති වාර්තාව නිවැරදිව සකස් නොකිරීමත්, අවශ්‍ය අවස්ථාවලදී ප්‍රසම්පාදන ඇස්තමේන්තු සකස් නොකිරීමත් හේතුවෙන් ජල පෝෂක සංරක්ෂණය සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදනයෙන් රු. 700,000 ක මුදලක් නැවත හරවා යවා තිබුණි. | | වූ බවත් දන්වමි. |

**3.2 පාඩු හා හානි**

---------------

2018 වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහනවලට අවස්ථා 180 කදී අනතුරු සිදු වී තිබුණු අතර විගණනයට ඉදිරිපත් කර මූල්‍ය ප්‍රකාශයට අනුව, 2018 වර්ෂයට පෙර සිදු වී තිබූ නමුත් අලාභ කපා නොහල / ඉදිරියට ගෙන ගිය අනතුරු සංඛ්‍යාව 144 ක් විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තු ලබා නොගැනීම/ අදාළ තොරතුරු නොමැති වීම හේතුවෙන් අලාභයේ වටිනාකම තීරණය කිරීමට නොහැකි වී තිබූ වාහන අනතුරු සංඛ්‍යාව 71 ක් ඒ තුළ විය. මෙම අනතුරු තුළ 2014 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා සිදු ව තිබූ අනතුරු ඇතුළත් විය. | අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2014, 2015 වර්ෂවලට අදාල අනතුරු සම්බන්ධ තොරතුරු නොමැතිවීම හේතුවෙන් නිරවුල් කළ නොහැකි තත්ත්වයක පවතී. 2016- 2018 යන වර්ෂවලදී සිදුවූ අනතුරු සම්බන්ධයෙන් මේ වනවිටත් එත්වැඩියාවන් සිදුවෙමින් පවතින අතර අළුත්වැඩියාවක් අවශ්‍ය නොවන අවස්ථාවන්ද ඇත. |
| (ආ) | අනතුරු සිදුව ඇත්තේ වසරකට වඩා ඉහත කාලයකදී වුවද ඇස්තමේන්තු ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් ඉදිරි කටයුතු සිදු නොවූ අවස්ථාද විය. | අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම කාර්යාලයට අයත් වාහන, වාහන හිමිකම් පවතින නිලධාරීන් වෙත හා නොයෙක් අංශ වෙත අනුයුක්ත කර ඇත. ප්‍රමාද වීම් සිදුවීමට වැඩි වශයෙන් බලපා ඇත්තේ අනතුර සිදුවූ වාහනය අළුත්වැඩියා කිරීම සඳහා වෙනත් සුදුසු වාහනයක් ප්‍රවාහන සංචිතය මඟින් ලබාදීමට නොහැකිවීම නිසාවෙනි. |
| (ඇ) | එසේම, පොත්වලින් කපා හැරීම් ප්‍රකාශයේ ඇතුළත් සමහර අනතුරුවලට ලක් වූ වාහන, අබලි වාහන වන බවත් 2018 වර්ෂය තුළ ඇස්තමේන්තු ලබා ගෙන තිබුණද, ඉදිරි කටයුතු සිදු වී නොමැති අවස්ථා | අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු | 2009 සිට 2014 දක්වා සිදුව තිබූ අනතුරු සම්බන්ධයෙන් එවකට කටයුතු කරන ලද නිලධාරීන්ගේ අවධානය යොමු නොකිරීම |

| | | | |
|---|---|---|---|
| | නිරීක්ෂණය විය. | කළ යුතුය. | මගින් රක්ෂණ වන්දි ලබාගැනීමේ කටයුතු සිදු කර නොතිබුණු අතර මේ වන විට 2009 සිට බොහෝමයක් අනතුරු සම්බන්ධ කටයුතු නිරවුල් කිරීමට හැකි වී ඇත. |
| (ඇ) | සුළු ප්‍රමාණයේ අලාභ සිදු වීම හේතුවෙන් වාහන අළුත්වැඩියා නොකර ධාවනයේ යොදවන අවස්ථා නිරීක්ෂණය වූ අතර මෙම තත්ත්වය ඉදිරි රක්ෂණ වන්දි ලබා ගැනීම්වලදී අහිතකර ලෙස බලපෑ හකි බව ද නිරීක්ෂණය විය. | අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2013, 2014 වර්ෂවල සිදුව තිබූ අනතුරු සම්බන්ධයෙන් එවකට නිලධාරීන් නිසි පරිදි අවධානය යොමු නොකිරීම මගින් වාහන අළුත්වැඩියාවකින් තොරව ගාල් කර තිබුණි. මේ හේතුවෙන් අනතුරු අළුත්වැඩියාව පමණක් සිදුකර අදාල වාහන ධාවන තත්ත්වයට ගෙන ඒමට නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104 (3) රෙගුලාසියට අනුව කිසියම් අනතුරක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් නිකුත් කිරීමට දින 07 ක ප්‍රමාදයක් සිදුවේ නම්, එම අනතුර සම්බන්ධයන් වහාම මූලික (ප්‍රාරම්භක) පරීක්ෂණයක් පවත්වා මූලික වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, මු.රෙ. 104(4) අනුව අනතුර සිදුවූ දින සිට මාස 03 ක් ඇතුළත පූර්ණ පරීක්ෂණයක් පවත්වා පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ. එසේ වුවද, ජනාධිපති කාර්යාලය විසින් එසේ මුදල් රෙගුලාසි 104(3) හා 104(4) ප්‍රකාරව කටයුතු කර නොතිබීම හේතුවෙන් අනතුරු සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගැනීමට නොහැකි වී තිබූ අතර, ඉදිරියේදී මේ තත්ත්වය වලක්වා ගැනීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කර නොතිබූ බව නිරීක්ෂණය විය | අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වාහන අධික වීම මගින් අනතුරු ප්‍රමාණයද අධිකව ඇති අතර සිදුවන සෑම අනතුරක් සම්බන්ධයෙන් එදිනම මෙම කාර්යාලය වෙත තොරතුරු නොලැබේ. එමගින් නිසි කාල සීමාවන් තුළ මු.රෙ. 104(3) හා 104(4) ඉටුකිරීමට නොහැකිව ඇත. එබැවින් මු.රෙ. 104 යටතේ පරීක්ෂණ පැවැත්වීම සඳහා සුදුසු පරීක්ෂණ මණ්ඩලයක් පත්කර අදාල පරීක්ෂණ කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

---------------------------------

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

---------------------------------------------------------------------------------------

ජනාධිපති කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය තනතුරු සංඛ්‍යාව පිළිවෙලින් 1,598 ක් හා 1,346 විය. ඒ අනුව පුරප්පාඩු කාර්ය මණ්ඩල සංඛ්‍යාව 262 ක් වුවද ජොෂ්ඨ මට්ටමේ අතිරික්ත කාර්ය මණ්ඩල සංඛ්‍යාව 10 ක් විය.